00040

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2021/2022
LLU5709- පරිපාලන නීතිය
කාලය - පැය එකයි. (01)

දිනය - 2022.09.13 වේලාව - ප.ව.01.30 - ප.ව.02.30

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
ප්‍රශ්න එකකට (01) පමණක් පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු විස්ස (20) බැගින් හිමි වේ.

01. රහල් යනු, ඒවියන් ඒවියේෂන් පෞද්ගලික සමාගමේ ගුවන් පියාසර උපදේශකවරයෙකු ලෙස සේවය කල වෘත්තීය වශයෙන් සුදුසුකම් ලැබූ වාණිජ ගුවන් නියමුවෙකි. ගුවන් නාවික පනතේ විධිවිධාන යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වරයා විසින් නිකුත් කරන ලද වාණිජ ගුවන් නියමු බලපත්‍රයක් ඔහු සතු විය. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා 2022 ජූලි 18 වන දිනැති තම ලිපිය මගින් ගුවන් නාවික රෙගුලාසි (ANR) 29(3) සහ 30 ට අදාල රෙගුලාසි උල්ලංඝනය කිරීම මත 2022 ජූලි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි රහල්ගේ බලපත්‍රය වසරකට අත්හිටුවා ඇත. අධ්‍යක්ෂවරයාගේ මෙම ක්‍රියාව 2022 ජූලි 08 වන දින පැවැත්වූ දැවැන්ත මහජන විරෝධතාවයක් මතින් නිසි අධිකාරියක් නොමැතිව නියමිත ආරක්ෂිත උන්නතාංශයට (Safe altitude) පහලින් පියාසර කරන ලද සිද්ධියක් පිළිබඳ විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙස සිදු වූවකි. මෙම සිදුවීම පිළිබඳව සොයා බැලීමට අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කලේය. 2022 ජූලි 12 වැනි දින පරීක්ෂණයක් පැවැත්වීමට කමිටුව තීරණය කළ අතර පරීක්ෂණයට දිනකට පෙර චෝදනා පත්‍රය යවා ඇත. තම නඩුවට සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව පවසමින් පරීක්ෂණය කල් දමන ලෙස රහල් ඉල්ලා සිටියේ ය. කෙසේ වෙතත්, කමිටුව ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කලේය. තමාට නීතිමය නියෝජනයක් ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙස රහල් කමිටුවෙන් ඉල්ලා සිටියේ ය. මෙයද කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීය. කෙසේ වෙතත්, එම පරීක්ෂණයේ දී රහල්ගෙන් ප්‍රශ්න කර ප්‍රකාශ සටහන් කර ඇත. අංක 30 දරණ රෙගුලාසිය උල්ලංඝනය

කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් තමාට කරුණු ඉදිරිපත් කිරීමට කම්ටුව අවස්ථාව ලබා දෙනු ලැබුව ද අංක 29(3) දරණ රෙගුලාසිය යටතේ කරන ලද පැමිණිල්ලක් පිළිබඳව තමාට දැනුම් දීමක් කර නොමැති බවට ඔහු චෝදනා කලේය.

පරීක්ෂණ කම්ටුව පරිපාලන නීතියේ අදාල මූලධර්මවලට අනුකූලව පරීක්ෂණය පවත්වා තිබේ ද යන්න පිළිබඳව රහල් ඔබගේ උපදෙස් පතයි.

රහල්ට උපදෙස් දෙන්න.

02. "පොදු නීතිය තුල පරම හෝ අසීමිත අභිමතයක් නොමැත. රාජ්‍ය නිළධාරීන් වෙත අභිමතය පවරා දී ඇත්තේ මහජනයා වෙනුවෙන් භාරයක් ලෙස, මහජන යහපත සඳහා එය භාවිතා කිරීමට ය. එම අභිමතය භාවිතා කිරීමේ යෝග්‍යතාවය විනිශ්චය කල යුත්තේ අදාල බලතල පවරා දීමේ අරමුණට සාපේක්ෂව ය."

*Premachandra v.Major Montague Jayawickrema (1994)2SLR90,105*

අභිමත බලය සම්බන්ධ අධිකරණ පාලනය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

හිමිකම් ඇවිරිණි.